# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ඇබෑර්තු

වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. රියදුරු
02. විඩියෝ කැමරාශිල්පී

## 01. රියදුරු

**රැකියා විස්තරය :**

- විශ්වවිද්‍යාලයේ වාහන ධාවනය කිරීම.
- ධාවනය සඳහා භාවිතා කරන ලද ඉන්ධන සහ ලිහිසි තෙල් පිළිබඳ ලොග් සටහන් පොතක් (ධාවන සටහන් පොතක්) පවත්වාගෙන යාම.
- විශ්වවිද්‍යාලයට අවශ්‍ය පරිදි නිවාඩු දිනවලදී සේවය සැපයීම.
- දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන පරිදි විශ්වවිද්‍යාල වාහන නිරන්තරයෙන් නඩත්තු කිරීම සහ රැකබලා ගැනීම.
- තමාට පවරා ඇති වාහනවල වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම සහ රක්ෂණය කිරීම නියමිත වේලාවට සිදු කිරීම.
- වාහනයේ ක්‍රියාකාරීත්වයට බලපාන දෝෂ පිළිබඳව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත වාර්තා කිරීම.
- සුළු අනතුරු සඳහා වුවද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කිරීම.
- වාහනය පදවන්නේ නැති අවස්ථාවලදී ආයතනික රාජකාරි කටයුතුවලට සහාය විය යුතුය.
- දෙපාර්තමේන්තු ප්‍රධානියා, අධ්‍යක්ෂ ජනරාල් හෝ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

**සුදුසුකම් :**

- **බාහිර :**
  - අධ්‍යාපනික: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් දෙකකින් (02) සමත් වී තිබීම.
  - සහ වෘත්තිය: බර වාහන ධාවනය සඳහා වලංගු බලපත්‍රයක් සහ පිළිගත් ආයතනයක බර වාහන ධාවනය පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද.
- **අභ්‍යන්තර :** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් දෙකකින් (02) සමත් වූ සහ බර වාහන ධාවනය සඳහා වලංගු බලපත්‍රයක් සමඟ ධාවනය පිළිබඳ වසර තුනක (03) පළපුරුද්ද ලබා ඇති ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු / ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ නිපුන සේවකයින්.

## 02. විඩියෝ කැමරාශිල්පී

**රැකියා විස්තරය :**

- කැමරා සහ අදාල අනෙක් උපකරණ නිෂ්පාදන සඳහා පිළියෙල කිරීමේදී ඒ සඳහා නිෂ්පාදකවරයාට සහාය වීම.
- කැමරා සහ අදාල උපකරණවල සාමාන්‍ය නඩත්තු කටයුතු හඳුනා ගැනීම, සිදු කිරීම සහ නිසි පරිදි ඒවා නිෂ්පාදක වෙත වාර්තා කිරීම.
- අදාල අංශ ප්‍රධානියා විසින් පවරනු ලබන පරිදි සිසුන් සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික සැසිවලට සහාය වීම.
- ඊට අමතරව අංශ ප්‍රධානි, අධ්‍යක්ෂ ජනරාල් හෝ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

- **බාහිර :**
  - අධ්‍යාපනික: අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් 02කින් සමත් වී තිබීම.
  - සහ වෘත්තිය: පිළිගත් ආයතනයක් විසින් පවත්වනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.
- **අභ්‍යන්තර :**
  අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සෑහිමකට පත්විය හැකි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ රජයේ තාක්ෂණික විද්‍යාලයක් විසින් පවත්වනු ලබන අදාළ වෘත්තිය පරීක්ෂණයකින් (Trade Test) සමත් වී ඇති ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු / ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ නිපුන කාණ්ඩයේ සේවකයින්.

---

**පත්වීමේ ස්වභාවය :** ස්ථිර පදනමින් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාර අරමුදලට දායකත්වය හිමි වේ.

**වයස :**

- වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**මාසික වැටුප් පරිමාණය :**

- U-PL 3 - 2025: 48.005-10*490-10*540-10*640-72,985/= (මසකට)

(කළමණාකරණ සේවා චක්‍රලේඛ 2025.03.25 දිනැති අංක 06/2025 හි විධි විධාන පරිදි වැටුප් ගෙවීම සිදු කෙරේ.)

**බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :**

ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සිදු කරනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙක් ම :**

I ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II තනතුරට අදාළ ව රාජකාරි නිසි අයුරින් ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි වන සේ මනා මානසික හා ශාරීරික සුවතාවයෙන් යුක්ත විය යුතුය.
III මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**❖ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය වන www.uovt.ac.lk ඔස්සේ බාගත කරගත හැකිය.**

**පොදු උපදෙස් :**

- මෙම තනතුරු සඳහා ස්ථාන මාරු වීම් අදාළ නැත.
- මෙම තනතුරු එකකට වඩා අයදුම් කිරීමට අදහස් කරනු ලබන අයදුම්කරුවන් ඒ සඳහා වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අදාළ අයදුම්පත් බහාලු කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.
- යම් අයදුම්කරුවෙකු මෙම තනතුරක් සඳහා තෝරාගතහොත් දැනට යම් ආයතනයක සේවය කරන්නේ නම් එම ආයතනයේ ප්‍රධානියා වෙතින් දරනු ලබන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කොට ලිපියක් ඉදිරිපත් කල යුතුය.
- සම්පූර්ණ කළ අයදුම්පත් මුද්‍රා තැබූ කවරයක බහා, උපකුලපති, වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල, රත්මලාන යන ලිපිනයට, 2026 ජුලි 21 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ උපකුලපති කාර්යාලය වෙත ගෙනැවිත් භාර දීම සිදු කල යුතුය.
- අසම්පූර්ණ ව ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
- බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- තෝරා ගැනීමේ ක්‍රමවේදයට යම් බලපෑම් සිදු කිරීමට උත්සහ ගැනීම නුසුදුසුකමක් සේ සැලකීමට සිදුවනු ඇත.
- සිංහල භාෂා දැන්වීමේ පවතින ඕනෑම ගැටලුකාරී/අපහැදිලි අවස්ථාවකදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ඉංග්‍රීසි භාෂාවෙන් පවතින බඳවාගැනීමේ පටිපාටිය බල පැවැත්වේ.

උපකුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,
අංක 100, කඳවල,
රත්මලාන.

Tel: 0112 630 704
Web: www.uovt.ac.lk

2026 ජුනි 21 වන දින.